# ලංසු සඳහා ආරාධනයයි

## අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා

## සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයේ ප්‍රදර්ශනවලට අදාළ අනුරු (Models) හා සන්ධාන කුටි (Dioramas) නිර්මාණය කිරීම සඳහා පළපුරුදු නිර්මාණ ශිල්පීන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

01. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයෙන් 2018 පෙබරවාරි 12 දින සිට 2018 මාර්තු 05 දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 03.00 දක්වා කාලය තුළ රුපියල් 1000/- ක ආපසු නොගෙවනු ලබන මුදලක් ගෙවීමෙන් ලංසු ලේඛන ලබාගත හැක.

02. ලංසු ලේඛන මිලදී ගැනීමට ප්‍රථම අවශ්‍ය නම් නිර්මාණය කිරීමට නියමිත අනුකෘති හා සන්ධාන කුටි වලට අදාළ පිරිවිතර සහ වෙනත් දත්ත www.museum.gov.lk යන කෞතුකාගාර වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මානව වංශ විද්‍යා අංශයට පැමිණීමෙන් (දු.ක. 0112667750) නොමිලයේ පරීක්ෂා කළ හැකිය.

03. පූර්ව ලංසු රැස්වීම (Pre-Bid meeting) 2018.02.20 දින පෙ.ව. 10.00 ට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේදී පැවැත්වෙන අතර, ලංසු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ට ඒ සඳහා ආරාධනය කෙරෙයි.

04. ලංසු ලියවිලි පිටපත් දෙකකින්, මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවර වල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

05. ලංසුපත් බහාලන ලියුම් කවරයේ උඩ වම් පස "පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයේ අනුරු නිර්මාණය කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

06. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු පත් 2018.03.06 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ප්‍රධාන ගණකාධිකාරී, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම මගින් හෝ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම මගින් සිදුකළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසු විවෘත කිරීම 2018.03.06 දින ප.ව. 2.00 ට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේදී සිදු කෙරෙයි. මෙම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

08. ලංසු ලේඛනයේ (ii) කොටසෙහි 1-12 දක්වා සඳහන් අනුරු / සන්ධාන කුටි අතරින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම සඳහා ලංසු ඉදිරිපත් කළ හැකිය.

09. ලංසු ඉදිරිපත් කිරීමේදී තමන් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකමින් 1% ක ප්‍රතිශත මුදලක් සඳහා රජයේ පිළිගත් බැංකුවක් මගින් ලංසු විවෘත කරන ලද දින සිට දින 90 කාලයක් සඳහා වලංගු, කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

10. ලංසු පිරිනැමීමේදී කෞතුකාගාරවල මීට පෙර මෙවැනි නිර්මාණ කාර්යයන් ඉටු කර පළපුරුද්ද ලබා ඇති නිර්මාණ ශිල්පීන් හට ප්‍රමුඛතාවය හිමි වේ.

11. අදාළ ලංසු සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුය.

**සභාපති,**
**පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාර ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.**